# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජුලි 2018

## (AA15) ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය
(Business Operations and Management)

---

**"ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය" විෂය ක්ෂෙත්‍රයේ සියලුම අංශ ආවරණය වන පරිදි දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්න පත්‍රයේ අරමුණ විය. එමෙන්ම ප්‍රායෝගික තත්ත්වයක්ද විද්‍යමාන වේ. මෙම පරීක්ෂක වාර්තාවේ ප්‍රධාන අරමුණ වන්නේ කාර්යසාධනය අඩු මට්ටමේ තිබූ ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමුකොට, අයදුම්කරුවන්ගේ අනාගත කාර්යසාධනය ඉහළ නංවාලීමට උපකාර වීමය.**

ඉතාමත් සීමිත පිරිසක් හැරෙන්නට මෙම විභාගයේදී විභාග අයදුම්කරුවන් සාර්ථක ලෙස උත්තර සැපයීමට සමත්වී ඇත. අයදුම්කරුවන් දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුනු දුර්වලතා කිහිපයක් පහත දැක්වේ:

## A - කොටස

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

විභාග අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සාර්ථකව උත්තර සපයා ඇති බව පරීක්ෂකවරුන්ගේ මතයයි. උපරිම ලකුණු ලබාගත් සීමිත අයදුම්කරුවන් පිරිසක්ද ලකුණු 20 ට වඩා ලබාගත් අයදුම්කරුවන් බහුතරයක්ද විය. මෙම ප්‍රශ්නයට පමණක් උත්තර සපයන ලද සීමිත අයදුම්කරුවන් පිරිසක්ද සිටියහ. තවද සමහර විභාග අයදුම්කරුවන් ප්‍රශ්න අංකය ලියා උත්තර අංකය ලිවීම වෙනුවට පිළිතුරු පත්වල උත්තරයද ලියා ඇති බව දක්නට ලැබුණි.

මෙම ප්‍රශ්නයේ පහත සඳහන් අනු කොටස්වලට සැලකිය යුතු පිරිසක් නිවැරදි උත්තර සපයා නොමැති බවද දක්නට ලැබුණි. එම ප්‍රශ්න අංක 1.8, 1.11, 1.13, 1.15 සහ 1.18 වේ. ප්‍රශ්න පිළිබඳ නිරීක්ෂණයන් පහත දක්වා තිබේ:

1.8 මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණේ සේවකයෙකු සංවිධානයකට විධිමත් ලෙස හඳුන්වාදීම පිළිබඳවය. බහුතරයක් අයදුම්කරුවන් වැරදි උත්තරය වූ "බඳවා ගැනීම" නිවැරදි උත්තරය ලෙස තෝරාගෙන තිබුණි.

1.11 රැකියා පිරිවිතරයක මූලිකාංග පිළිබඳව යොමු වූ මෙම ප්‍රශ්නයට නිවැරදි උත්තරය"විශේෂ ශාරීරික හැකියාවන්" වුවද ඒ පිළිබඳව නිවැරදි දැනුමක් සහ අවබෝධයක් නොමැති නිසා වැරදි උත්තර තෝරාගෙන තිබුණි.

1.13 "සත්‍ය වෙළෙඳපොළ" පිළිබඳව විමසා තිබූ මෙම ප්‍රශ්නයටද ඉතාමත් දුර්වල ලෙස උත්තර සපයා තිබුණි. දී තිබූ කිසිදු වෙළෙඳපොළ වර්ගයක් පිළිබඳ කිසිදු අවබෝධයක් අයදුම්කරුවන්ට නොමැති බව පැහැදිලි විය.

1.15 පහසුකම් පිරියතයක අරමුණක් නොවන්නේ "ශ්‍රම පිරිවැටුම වැඩි කිරීම" යන උත්තරය වුවද පහසුකම් පිරියත පිළිබඳ මනා අවබෝධයක් නොමැතිකමින් වැරදි උත්තර තෝරාගෙන තිබුණි.

1.18 පෝටර්ගේ වටිනාකම් දාමයේ උපකාරක ක්‍රියාකාරකමක් වනුයේ "තාක්ෂණික සංවර්ධනය" යි. කෙසේවෙතත් එම සංකල්පය පිළිබඳව නිවැරදි අවබෝධයක් නොවූ බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි උත්තරය ලෙස අලෙවිකරණය සහ විකුණුම් තෝරාගෙන තිබුණි.

මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.

## B - කොටස

මෙම කොටසේ එකකට ලකුණු 10 බැගින් ලැබෙන අනිවාර්ය ප්‍රශ්න 4 ක් සඳහා ලකුණු 40 ක් වෙන්කර තිබුණි.

### ප්‍රශ්න අංක **02** - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

**(a) කොටස**

කේවලස්වාමි ව්‍යාපාරයක වාසි සහ අවාසි සඳහන් කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය. මෙම ප්‍රශ්නයේදී බහුතරයක් අයදුම්කරුවන් ලකුණු 3 ක් හෝ ඊට වැඩියෙන් ලබාගෙන තිබූ බවත්, අයදුම්කරුවන්ගෙන් සීමිත පිරිසක් පමණක් අඩු ලකුණු ලබාගෙන ඇති බවත් දක්නට ලැබුණි. එමෙන්ම වාසි වෙනුවට ලක්ෂණ සඳහන් කර ඇති බවද, අදාලත්වයක් නොමැති කරුණු සඳහන් කර ඇති බවද දක්නට ලැබුණි.

**(b) කොටස**

ව්‍යාපාර සංවිධානයක් සඳහා උපකාරක සේවාවක් වශයෙන් බැංකුවලින් සහ මූල්‍ය ආයතනවලින් ලබාගත හැකි සේවා සඳහන් කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය කෙරිණි. මෙම ප්‍රශ්නයට බහුතරයක් අයදුම්කරුවන් ලකුණු 3 ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇති බවද සීමිත පිරිසක් අඩු ලකුණු ලබා ඇති බවද දක්නට ලැබුණි. එමෙන්ම කල්බදු පහසුකම්, බෝනස් හා ප්‍රතිලාභ, රක්ෂණ සේවා වැනි නොගැලපෙන උත්තරද සඳහන් කර ඇති බව දක්නට ලැබුණි.

### ප්‍රශ්න අංක **03** - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

**(a) කොටස**

මෙම ප්‍රශ්නයෙන් ව්‍යාපාර සංවිධානයක් කෙරෙහි තත්ත්ව කළමනාකරණයෙහි වැදගත්කම පැහැදිලි කිරීම අවශ්‍ය විය. මෙම ප්‍රශ්නයට යම් ප්‍රමාණයක ලකුණු ලබා තිබුණත් උපරිම ලකුණු ලබා ගැනීමට නොහැකි වී ඇත. විභාග අයදුම්කරුවන් ප්‍රශ්නය අවබෝධ කර නොගෙන උත්තර සපයා තිබුණි. ව්‍යාපාර සංවිධානයකට තත්ත්ව කළමනාකරණයෙහි වැදගත්කම නොව පාරිභෝගිකයාට එය වැදගත් වන ආකාරය පැහැදිලි කර තිබූ අවස්ථාද දක්නට ලැබුණි. මෙයට හේතුව වන්නේ ප්‍රශ්නය නිවැරදිව කියවා අවබෝධ කර නොගැනීමය.

**(b) කොටස**

නිෂ්පාදිතවල ගුණත්වම මැනීමේ මානයන් හතරක් හඳුනා දැක්වීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය. නිෂ්පාදිතවල ගුණත්වය පිළිබඳ මානයන් පිළිබඳව අවබෝධයක් අයදුම්කරුවන්ට නොතිබූ බවත් ප්‍රශ්නය හරිහැටි තේරුම් නොගෙන ඇති බවත් දුර්වල ලෙස උත්තර සපයා ඇති බවත් දක්නට ලැබුණි. එමෙන්ම අසුරුම, මිල, කල් ඉකුත්වන දිනය, යනාදී වැරදි උත්තර සපයා ඇති බවත් දක්නට ලැබුණි.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

**(a) කොටස**

සංවිධානයක් සඳහා මානව සම්පත් කළමනාකරණයේ වැදගත්කම පැහැදිලි කළ යුතුව තිබුණි. මෙම කොටසට උත්තර සැපයීම දුර්වල මට්ටමක පැවතුණි. බහුතරයක් අයදුම්කරුවන්ට අඩු ලකුණු ලබා ගැනීමට සිදුවිය. සම්පූර්ණ ලකුණු ලබාගත් ඉතාම සීමිත අයදුම්කරුවන් ප්‍රමාණයක් සිටි අතර, සාමාන්‍ය මට්ටමේ ලකුණු ලබාගත් අයදුම්කරුවන් පිරිසක්ද විය. මානව සම්පත් කළමනාකරණයේ වැදගත්කම වෙනුවට එහි ඉතිහාසය, කාර්යයන් සඳහන් කිරීමෙන් ප්‍රශ්නය තේරුම් නොගත් බවක්ද පෙනී ගියේය. උත්තරයට අදාල පැහැදිලි කිරීම්ද සිදුකර නොතිබුණි.

**(b) කොටස**

පුහුණු කිරීමේ ක්‍රියාවලියේ ඇතුලත් පියවරයන් හඳුනා දැක්වීම අවශ්‍ය කෙරිණ. මෙම කොටසට උත්තර ලිවීම ඉතාමත් අවම මට්ටමක පැවතුණි. තවද නිවැරදි උත්තර සැපයූ අයදුම්කරුවන් සිටියේ ඉතාමත් අඩු ප්‍රමාණයකි. පුහුණු කිරීමේ ක්‍රියාවලියේ පියවර වෙනුවට පුහුණු කිරීමේ විධි ඉදිරිපත් කර තිබුණි. තවද සමහර අයදුම්කරුවන් බඳවා ගැනීමේ පියවර දක්වා තිබුණි. මෙම ප්‍රශ්නය අයදුම්කරුවන් විසින් ඉතා අසාර්ථක ලෙස උත්තර සැපයූ ප්‍රශ්නයකි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

**(a) කොටස**

ව්‍යාපාර සංවිධානයකට අලෙවිකරණය වැදගත් වන්නේ කුමක් නිසාදැයි යන්නට හේතු පැහැදිලි කිරීම අවශ්‍ය කෙරිණ. මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් වැඩි දෙනෙක් අඩු ලකුණු ලබාගෙන තිබුණි. සුළු පිරිසක් පමණක් සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. ලකුණු ලබාගැනීමට අපොහොසත්වීමට හේතුව වන්නේ අලෙවිකරණ සංකල්පය පිළිබඳ දැනුවත් වුවද ප්‍රායෝගිකව ගත්කල ව්‍යාපාර සංවිධානයකට අලෙවිකරණය වැදගත් වන්නේ කෙසේද යන්න පිළිබඳව අවබෝධයක් නොතිබීමය.

**(b) කොටස**

සාර්ථක සන්නමක ලක්ෂණ 4 ක් හඳුනා දැක්වීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය. මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් ඉතා අඩු ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි. සන්නමක ලක්ෂණ පිළිබඳව අවබෝධයක් අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙකුට නොමැති බවත් විෂය ක්ෂේත්‍රය පිළිබඳව දැනුම අඩු බවත් දී තිබූ වැරදි උත්තරවලින් ගම්‍ය විය. සන්නම්කරණයේ මූලික සංකල්ප පිළිබඳව අයදුම්කරුවන් නිසිලෙස දැනුවත් වී නොමැති බැවින් මෙම ප්‍රශ්නයට උත්තර සැපයීම බොහෝ දෙනා අත්හැර දමා ඇත. ස්ව-අධ්‍යයන පාඩම් පොත නිසිලෙස අධ්‍යයනය කර නොමැති බව දක්නට ලැබුණි.

# C - කොටස

මෙම කොටස ලකුණු 20 ක සිද්ධි අධ්‍යයනයක් ඇතුලත් අනිවාර්ය ප්‍රශ්නයකින් සමන්විත විය.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

**(a) කොටස**

දී ඇති සංවිධානය කෙරෙහි ගෝලීයකරණය ධනාත්මකව බලපා ඇති ආකාරයන් පැහැදිලි කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය. මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් නිවැරදිව උත්තර සපයා ඇත. ප්‍රශ්නයේ සඳහන් සිද්ධියට අදාලව ගෝලීයකරණයේ ධනාත්මක බලපෑම එම ඡේදය තුලින්ම ලබාගත් කරුණු ආශ්‍රයෙන්ම උත්තර ලෙස සපයා අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් සැලකිය යුතු මට්ටමකින් ලකුණු ලබාගෙන තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක්ම මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත්ව තිබුණි.

**(b) කොටස**

එම සමාගමෙහි අලෙවිකරණ මිශ්‍රයේ 4'P's බහුතරයක් අයදුම්කරුවන් හඳුනාගෙන ඇති අතර සිද්ධිය ඇසුරින් එයට සාර්ථකව උත්තර සපයා තිබුණි. කෙසේවෙතත්, ප්‍රවර්ධනය සහ ස්ථානය පිළිබඳව නිවැරදිව අවබෝධ කර නොගත් සුළු පිරිසක් වැරදි ලෙස ඒවා පැහැදිලි කර තිබුණි.

**(c) කොටස**

ව්‍යාපාර ක්‍රියාවලිය බාහිර මූලාශ්‍රගතකරණය කිරීමේ වාසි සහ අවාසි සඳහන් කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය කෙරිණ. මෙහිදී බහුතරයක් අයදුම්කරුවන් මේ පිළිබඳව අවබෝධ කරගෙන නොමැති බව දක්නට ලැබුණි. 6 වැනි ප්‍රශ්නයේ අයදුම්කරුවන්ගේ උත්තර සැපයීම දුර්වල මට්ටමක පැවතියේ මෙම කොටස සඳහාය. බහුතරයක් අයදුම්කරුවන්ට නිවැරදි උත්තර සැපයීමට නොහැකි වූ බව දක්නට ලැබුණි. ඇතැම් අයදුම්කරුවන් "බාහිර මූලාශ්‍රගතකිරීම" යන්න පිළිබඳව කිසිදු කරුණක් නොදැන සිටි බව දී තිබූ වැරදි උත්තරවලින් ගම්‍ය විය.

**(d) කොටස**

මෙම සමාගමේ ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශවයන් 4 ක් හඳුනා දැක්වීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය. මෙම ප්‍රශ්නයට සියලුම අයදුම්කරුවන් සාර්ථක ලෙස උත්තර සපයා ලකුණු 4 ම ලබාගෙන තිබුණි. සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි වී තිබුණේ ඉතාමත් සීමිත අයදුම්කරුවන් පිරිසකටය.

ප්‍රශ්න අංක 6 ප්‍රායෝගික ප්‍රශ්නයක් වූ බැවින් සමස්තයක් ලෙස ගත්කල අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් ඒ සඳහා උත්තර සපයා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබූ බව දක්නට ලැබුණි.

1 වැනි ප්‍රශ්නයට සහ 6 වැනි ප්‍රශ්නයට නිවැරදි උත්තර සැපයීම තුලින් ව්‍යාපාර මෙහෙයුම් හා කළමනාකරණය විෂයය සමත්වීමට විභාග අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙකුට හැකියාව ලැබී ඇති බව දක්නට ලැබුණි.

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැළකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති දෙයට පමණක් උත්තර ලිවීම. නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකිරීම.

3. ස්ව-අධ්‍යයන පාඩම් මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

4. පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීම සහ අවශ්‍ය කුසලතා ගොඩ නගා ගැනීම.

5. අත් අකුරු කියවිය හැකි ආකාරයටත්, ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කිරීම.

6. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

7. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කර ගැනීම.

8. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

9. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.

10. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -